294620

OL/2018/21/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II |
| சிங்கள மொழியும் இலக்கியமும் | I, II |
| Sinhala Language and Literature | I, II |

2018.12.04 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** ඔහු අදහස් ප්‍රකාශ කළේ **උගුරට හොරා බෙහෙත් කන්නා සේ** ය.
(1) කිසිවකුට නොදැනෙන්නාක් මෙන්
(2) උගුරට නොදැනෙන පරිදි බෙහෙත් ගිලින්නාක් සේ
(3) අනුන්ගේ බලකිරීම ඉටු කරන්නාක් මෙන්
(4) යමක් වසන් කරන්නාක් මෙන්

**2.** **අල්ලේ පැළවෙන බොරු** කීමෙන් සමහරු තම කීර්තිනාමය නැති කර ගනිති.
(1) කෙනකු රවටන බොරු බස්
(2) කෙසේ වත් විශ්වාස කළ නොහැකි දේ
(3) ඇදහීමට තරමක් දුෂ්කර කරුණු
(4) අල්ල මත පැළවෙන දේ

**3.** කියන දෙයක් **වහෙන් ඔරෝ** නො කියා කෙළින් කියන්න.
(1) ඍජු ආකාරයෙන්
(2) ඔහෙන් වරෝ යන ලෙසින්
(3) ව්‍යංග්‍යයෙන්
(4) කෙනකුට නොදැනෙන අයුරින්

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** තාරකා විද්‍යාඥයෝ උපකරණ භාවිතයෙන් ග්‍රහවස්තුන්ගේ පිහිටීම ...................... කර අනාවැකි පළ කරති.
(1) පරීක්ෂණය (2) නිරීක්ෂණය (3) අධීක්ෂණය (4) අන්වේෂණය

**5.** භාෂාවක අර්ථ ප්‍රකට කිරීමෙහි ලා ............................ ඉතා වැදගත් ය.
(1) ශබ්දෝච්චාරණය (2) සුබෝච්චාරණය (3) සාවද්‍යෝච්චාරණය (4) අනුච්චාරණය

**6.** අධ්‍යාපනයෙහි දී .................... හිමි විය යුත්තේ ප්‍රමාණාත්මකභාවයට නො ව ගුණාත්මකභාවයට ය.
(1) ප්‍රමුඛත්වය (2) ප්‍රබලත්වය (3) යෝග්‍යත්වය (4) උචිතත්වය

[දෙවැනි පිටුව බලන්න.

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අවිස්සාවේල්ල, අම්පාර, අඟේවෙල
(2) රත්නපුරය, රන්ටැඹේ, රන්දෙණිගල, රතුපස්වල
(3) කඩුවෙල, කතරගම, කන්කසන්තුරේ, කල්මුනේ
(4) ගල්කිස්ස, ගල්ගමුව, ගම්පොළ, ගණේමුල්ල

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) වීරෝදාර, මර්දනය, ප්‍රතිඵල, ප්‍රස්තාවනාව
(2) දර්ශන, විමර්ශණ, සර්ෂණ, තීක්ෂ්ණ
(3) නර්ථන, නිශ්ශංකමල්ල, ලංකේශ්වර, වර්ධනය
(4) නින්දාලාප, කර්ණරසායන, සංශරණය, ප්‍රතිලාභ

**9.** එක් එක් වචනයේ **දෙවෙනි අකුරෙහි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය** හා **ගැට ඇලපිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අභූත, විවෘත, අලියා, නිවැරදි
(2) අලියා, අභූත, විවෘත, නිවැරදි
(3) විවෘත, අලියා, නිවැරදි, අභූත
(4) අලියා, අභූත, නිවැරදි, විවෘත

**10.** 'රතුපුල්' යන්න අයත් වන්නේ,
(1) අන්‍යාර්ථ සමාසයට ය.
(2) විශේෂණ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය.
(4) අව්‍යය සමාසයට ය.

**11.** උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) දරුවෙක්, මම, දෙවඟනක්, ලේඛකයෝ
(2) ළමයින්, මිනිසා, වඳුරෙක්, ශිෂ්‍යාවක
(3) මා, බඹකු, නයෙක්, ගුරුවරු
(4) ධාවකයෙක්, නිළියක්, හා, දිවියෙක්

**12.** 'ප්‍රසංග + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රාසාංගික (2) ප්‍රසාංගික (3) ප්‍රාසංගික (4) ප්‍රසංගික

**13.** "භයානක වග වලස් ආදීහු වනයෙහි ඔබ-මොබ සැරි සරති." යන වාක්‍යයේ 'වනයෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) සම්බන්ධ (2) ආධාර (3) සම්ප්‍රදාන (4) කර්ම

● අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

**14.** වත්මන් තරුණ පරපුරට සාහිත්‍ය මූලධර්ම පිළිබඳ **පෘථුල** අවබෝධයක් නැත.
(1) ප්‍රමාණවත් (2) පරිණත (3) පළල් (4) ගැඹුරු

**15.** යුද්ධයෙන් දිනීමට නම් සතුරු සේනා **මුලෝත්පාටනය** කළ යුතු ය.
(1) ඝාතනය
(2) මුලිනුපුටා දැමීම
(3) උදුරා දැමීම
(4) ඡේදනය

**16.** 'ව' යනු **දන්තෞෂ්ඨජ** අක්ෂරයකි.
(1) දත්වලින් හටගන්නා
(2) තොල්වලින් හටගන්නා
(3) දත්වලින් හා බොටුවෙන් හටගන්නා
(4) දත්වලින් හා තොල්වලින් හටගන්නා

**17.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) තද්ධිත - සිරිමත්, දිරිමත්, කුල්මත්, ඉසුරුමත්
(2) සන්ධි - නිලුපුල්, වමත, දබරැඟිල්ල, පුරඟන
(3) කෘදන්ත - නැටිලි, පැනිලි, දිවිලි, විමසිලි
(4) විධික්‍රියා - බලව, කරව්, කියග, දුව

**18.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නො පවත්නා** පද පේළිය තෝරන්න.
(1) ලෝපය, ආදේශය, ආගමය, දීර්ඝය
(2) කණ්ඨජ, අණ්ඩජ, තාලුජ, මූර්ධජ
(3) ත්‍රිකෝණය, චතුරස්‍රය, රොම්බසය, ෂඩාස්‍රය
(4) පුස්තකය, පරිච්ඡේදය, ඡේදය, වාක්‍යය

**19.** එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) කත - කාන්තාව, සියපත - නෙලුම, පර්වතය - ගිරි, නුවණ - ඇස
(2) කුරුල්ලා - විහඟ, ශාස්ත්‍රය - ධර්මය, වත - මුහුණ, මත්ස්‍යයා - මසු
(3) වෙළෙන්දා - වාණිජ, රථය - රිය, දෙවියා - අසුර, අත - බාහු
(4) වෘක්ෂය - ගස, මල - පුෂ්පය, අලුයම - ප්‍රභාතය, හිස - ශීර්ෂය

**20.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) භූමි - පොළොව, පඨවි, මිහි, ධරණි
(2) සූර්යයා - රවි, හිරු, දිනකර, දිනිඳු
(3) මුහුද - සයුර, ජලනිධි, සමුද්‍රය, කරදිය
(4) සුළඟ - වායු, නල, වාතය, පවන

**21.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) ප්‍රබුද්ධ - සුප්‍රබුද්ධ
(2) ආගමන - විගමන
(3) ශත්‍රු - මිත්‍ර
(4) උක්ත - අනුක්ත

**22.** **මිශ්‍ර ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) සංචාරකයා සමින් මැසූ පාවහන් පැළඳ ගමන් කළේ ය.
(2) අසරණ දරුවා සිඟා ගත් බත් කමින් සිටියේ ය.
(3) බන්ධනාගාර නිලධාරියා සිරකරුවා යකඩ දමින් බැඳ එතැනට ගෙන ආවේ ය.
(4) දුටුගැමුණු රජතුමා 'ස්වර්ණමාලි' නමින් මහාථූපය නම් කළේ ය.

**23.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'රේඵය' වෙනුවට 'ර්' යන්න යෙදිය හැකි ය.
(2) 'අසම්භාව්‍ය ක්‍රියාව' කාලාර්ථයේ මෙන් ම අනියමාර්ථයේ ද යෙදේ.
(3) 'නටමි' යනු වර්තමාන කාල, උත්තම පුරුෂ ඒක වචන ආඛ්‍යාත පදයකි.
(4) 'ඓතිහාසික' යන වචනය මෙන් ම 'ඓෙතිහාසික' යන්න ද නිවැරදි ය.

**24.** දන්තජ අක්ෂර පමණක් අන්තර්ගත වචනය තෝරන්න.
(1) සැනසුම (2) ලස්සන (3) දවස (4) තනතුර

**25.** පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ග්‍රන්ථ කර්තෘ නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) ද්‍යා ච වි ච ති න් ක්‍ර
(2) ගි ල අ ව න කු න් ය
(3) ර් සේ ධ න ම
(4) ගෝ කු එ මී රු

● අංක **26** හා **27** ප්‍රශ්න යටතේ දී ඇති **ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

**26.** වඳින්න ගිය දේවාලෙ හිස මත කඩා වැටුණා වාගේ
(1) දේවාලය දිරා ගොස් තිබූ නිසා හිස මත කඩා වැටීම
(2) යම් පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට එය ඉටු නොවීම
(3) එක් කරදරයක් අතරතුර තවත් කරදරයකට මුහුණ දීම
(4) පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට තවත් විපතකට මුහුණ පෑම

**27.** ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වාගේ
(1) ලබා ගත නොහැකි දෙයකට බලාපොරොත්තු තැබීම
(2) ඉතා අමාරුවෙන් යමක් ලබා ගැනීම
(3) නැති දෙයක් කෙසේ හෝ ලබා ගැනීම
(4) සඟවාගෙන තිබෙන දෙයක් ඉල්ලා ගැනීම

**28.** A - දැස - ස්වරාදේශ සන්ධිය
B - පොල්ලත්ත - පරරූප සන්ධිය
C - මලසුන - ස්වර සන්ධිය
D - මුනිතුමා - පූර්ව ස්වර ලෝප සන්ධිය

A, B, C, D යෙදුම් අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

[හතරවැනි පිටුව බලන්න.

HELPMATE

● අංක **29** හා **30** යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) මම ද නංගී ද මල්ලී ද ගමට යති. (2) මම ද නංගී ද මල්ලී ද ගමට යමු.
(3) මම ද නංගී ද මල්ලී ද ගමට යයි. (4) නංගී ද මල්ලී ද මම ද ගමට යමි.

**30.** (1) ගායකයෝ ගී නො ගයති'යි පිරිස හූ කීහ.
(2) දරුවන් පිණිස යමක් කරන්නැ'යි නගරාධිපතිතුමා ඉල්ලා සිටියහ.
(3) සියලු ජාතීන් සාමයෙන් ජීවත් වෙත්වා!
(4) එදිරිවීර සරච්චන්ද්‍ර දක්ෂ නාට්‍යකරුවකු මෙන් ම ප්‍රකට නවකථා රචකයෙක් ද විය.

**31.** A - පොදු ජනයාගේ දැන ගැනීම .................... මේ පත්‍රිකාව බෙදා හරිමි.
B - ගුරුවරුන් එතැනට පැමිණි ...................... ශිෂ්‍යයෝ අරගලය නතර කළහ.
C - ගුත්තිල පඬිතුමා, මූසිල දරුවකු .................... රැක බලා ගත්තේ ය.
D - කොග්ගල මහා ප්‍රාඥයා ...................... මාර්ටින් වික්‍රමසිංහ ගම්පෙරළිය රචනා කළේ ය.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
E - මෙන් F - උදෙසා G - හෙවත් H - නිසා
(1) H, E, F, G (2) F, E, G, H (3) F, H, E, G (4) F, E, H, G

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං ඉඳ හිට වෙල පැත්තට යනවා"
(1) මම කලාතුරකින් කුඹුර දෙසට යමි.
(2) මම බොහෝ කලකට පසු කුඹුරට යමි.
(3) මම ඉඳ හිට කුඹුර දෙසට ගොස් පැමිණෙමි.
(4) මම මාස කිහිපයකට පසු ව කුඹුරට යමි.

**33.** 'හඳ සහ නිව්යෝර්ක් නුවර' නමැති පද්‍ය නිර්මාණය
(1) ගුණදාස අමරසේකරගේ ය. (2) මහගම සේකරගේ ය.
(3) විමල් දිසානායකගේ ය. (4) පරාක්‍රම කොඩිතුවක්කුගේ ය.

**34.** **රූපකයක් රහිත** වරණය තෝරන්න.
(1) රුවින දිලෙන අබරණ කැලුම ගත යෙදී
(2) කුරා කුහුඹු මිනිස් යන්ත්‍ර
(3) මී දේ දුව ඉසට නැඟූ ව - ඉඳුනිල් මිණි සේසතක් ය
(4) මිහිලිය නළලේ අංජන තිලකේ

**35.** "හිරි ඔතප් ලද නියාවට කාරණ පැවා සේ වාලධිය අමුඩු හස්සෙහි ගන්වා" යන පාඨයෙහි 'වාලධිය' යන වචනයේ අර්ථය කුමක් ද?
(1) පසු පස කකුල (2) කන්දෙක
(3) අමුඩය (4) වල්ගය

**36.** පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.
"පෙර විරුවන් ඔබගෙ පුතේ
ඉදි කළ වැව් බලන් පුතේ
.................................
ඒ මහ වැව් බැඳුණෙ පුතේ"

(1) ඈ උරුමය ඇතිව සිතේ
(2) ඇතේ සවියෙනුයි පුතේ
(3) සුරුවිරුකම් ඔබට ඇතේ
(4) මවු බිම දෙස බලන් පුතේ

[පස්වැනි පිටුව බලන්න.

HELPMATE

**37.** "ඔන්න මං ගැටය කාලෙ නං නේරු අගමැතිතුමා ඉස්සරහ, මහ රැජින ඉස්සරහ, සියං කුමාරයා ඉස්සරහ නැටුං නටල ප්‍රශංසා ලබලා තියෙනවා" මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?

(1) තල මල පිපිලා
(2) හුණුවටයේ කතාව
(3) සිංහබාහු
(4) ගුරුතරුව

**38.** හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'වාංපතුල්' යනු,

(1) මර උගුල් ය.
(2) වඳුරන්ගේ පාදයන් ය.
(3) පාවහන් ය.
(4) සතුන්ගේ හම්පොතු ය.

**39.**

"උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැළ"

යන කවියෙන් කියැවෙන්නේ,

(1) වන වැනුමක් ගැන ය.
(2) හිරු බැස යන අවස්ථාවක් ගැන ය.
(3) රජකුගේ සිරි යහනක් ගැන ය.
(4) නිශා වර්ණනයක් ගැන ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

"මතු පිටින් පෙනෙන වාච්‍යාර්ථය නොව ව්‍යංග්‍යාර්ථය ද අවබෝධ කළ යුතු ය. බසේ බුද්ධිගෝචර වන කොටස පමණක් නො ව හෘදයගෝචර වන කොටස ද දත යුතු ය."

(1) වචනාර්ථය හා ව්‍යංග්‍යයෙන් කියවෙන අර්ථ අවබෝධ කළ යුතු අතර හදවතට හා බුද්ධියට ගෝචර වන කොටස් දැන ගැනීම ප්‍රමාණවත් ය.
(2) මතු පිටින් පෙනෙන අර්ථ හා ව්‍යංග්‍යයෙන් කියැවෙන කොටස් අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.
(3) වචනයේ මතු පිට අර්ථය මෙන් ම ව්‍යංග්‍යයෙන් කියැවෙන අර්ථය ද බුද්ධියට ගොදුරු වන කොටස මෙන් ම හදවතට ගොදුරු වන කොටස ද අවබෝධ කර ගත යුතු ය.
(4) මතු පිටින් පෙනෙන වචනාර්ථය අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.

* *

[හයවැනි පිටුව බලන්න.

HELPMATE

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்கள மொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
  (අ) වළ (ආ) වල

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
  "ඒ සමිතියේ සභාපතිත්වය දරණ තැනැත්තා දේශදේශාන්තරයෙහි කීර්තියක් ඇති අග්‍රගන්‍ය පඬිවරයෙකි."

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා, සන්ධි වර්ගය නම් කරන්න.
  (අ) සහ + උදර (ආ) රුක් + අත්තන

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් **උපසර්ග පද දෙකක්** උපුටා දක්වන්න.
  "අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රතිඵලදායක බව විදුහල්පතිතුමා පැවසීය."

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
  (අ) පළල (ආ) සරල

(vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
  (අ) තමාගේ ම අභිමතයට අනුව වැඩ කරන
  (ආ) එක් ඇසක් පමණක් පෙනෙන තැනැත්තා

(vii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
  (අ) අප සංගමයේ සභාපති නොහොත් සභාපතිනිය සභාව අමතන්නේ ය.
  (ආ) ලාංකික ක්‍රීඩකයෝ තරගය ජය ගනීවි.

(viii) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
  (අ) දරුවන් ගී **ගයද්දී** දෙමවුපියෝ තුටු වෙති.
  (ආ) "**බල** සුබ නිමිති පෙරමග නැකතටත් වැඩි"

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
  (අ) පාසල් ශිෂ්‍යයා
  (ආ) විදෙස් ප්‍රවෘත්ති

(x) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද **දෙක** තෝරා වෙන වෙන ම ලියන්න.
  "ගෙවල් දොරවල් බැලීමට පැමිණි තරුණයාගේ වං හුං දැනගත් මවුපියෝ ඔහුට අකැමති වූහ."

(ලකුණු 02 × 10 = 20 යි)

[හත්වැනි පිටුව බලන්න.

**2.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) ජංගම දුරකථනය මුළු ලෝකය ම සියතට ගත හැකි විස්මය ජනක උපකරණයකි. වර්තමානය වන විට එය බහුකාර්ය උපකරණයක් බවට පත්වී ඇත. මිනිසාගේ යහපතට මෙන් ම අයහපතට ද එය භාවිත කළ හැකි ය. නූතන තරුණ පරම්පරාව සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයට බෙහෙවින් ම ඇබ්බැහි වී ඇත්තේ ද ජංගම දුරකථනය නිසා ය. මේ අතර ජංගම දුරකථනය හා එමගින් භාවිත කළ හැකි සමාජ ජාලා වෙබ් අඩවි අධ්‍යාපනික කාර්යය මෙන් ම සමාජ යහපත ද වෙනුවෙන් භාවිත කළ හැකි අවස්ථා එමට ය. එය තරුණ පරම්පරාවේ අධ්‍යාපනික සංවර්ධනයට මෙන් ම සමාජ ප්‍රගමනයට ද රටේ සංවර්ධනයට ද දායක කර ගත හැකි ය. සමස්ත ප්‍රජාව ම මේ පිළිබඳ අවධානය යොමු කළ යුතු කාලය එළඹ ඇත.

(ආ) ක්‍රීඩාව රටක සෞඛ්‍ය සම්පන්නභාවය පිළිබිඹු කරන දර්ශකයකි. ශ්‍රී ලංකාව ද විවිධ ක්‍රීඩා ඉසව් මගින් ලෝකය තුළ නමක් රඳවාගෙන ඇත. ක්‍රිකට්, මලල හා දැල්පන්දු ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනියි. ක්‍රීඩාව මගින් රටේ තරුණ පරම්පරාවෙහි සෞඛ්‍යය, සමබර පෞරුෂය, නායකත්ව ගුණාංග, ජය පරාජය ඉවසීමේ ගුණය හා සාමූහිකත්වය ආදි යහපත් ගුණාංග රාශියක් වර්ධනය වේ. ක්‍රීඩාවට මුල් තැනක් දී ක්‍රීඩකයන් දිරිගැන්වීම රටක වගකීමක් හා යුතුකමක් වෙයි. නූතන පරම්පරාව ක්‍රීඩාව වෙත නැඹුරු කරවීමට අවශ්‍ය පෙලඹවීම ඇති කිරීමත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමත් මගින් ශ්‍රී ලංකාව ලෝකයෙහි දිදුලන නාමයක් බවට පත් කර ගත හැකි ය.

(ඉ) ශ්‍රී ලංකාව විදේශීය සංචාරකයන්ගේ පාරාදීසයකි. අතීත මිනිසුන් විසින් දායාද කරන ලදුව ප්‍රෞඪ ජාතියක අනන්‍යතාව රැක දෙන විවිධ විස්මිත නිර්මාණ ද ස්වභාව සෞන්දර්යයෙන් අනූන වූ ස්ථාන ද නරඹා සතුටු වීමට සංචාරකයෝ ඉමහත් කැමැත්තක් දක්වති. මෙරටට විශාල විදේශ විනිමයක් උපයා දෙන එම ජාතික උරුමයන් වර්තමානය වන විට විනාශ මුඛයට යමින් පවතින බව බොහෝ දෙනාගේ අදහස යි. මේ උරුමයන්ට හානි පමුණුවන්නේ ද මිනිසා ම ය. එබැවින් අනාගත පරම්පරාව සඳහා ඒවා රැකගැනීමට කටයුතු කිරීම අප කාගෙත් වගකීමක් හා යුතුකමක් ද වේ.

(ඊ) ස්වාභාවික විපත් සහ ආපදා තත්ත්ව ගැන ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් නිතර අසන්නට ලැබේ. ගංවතුර, නායයෑම් හා නියඟ වැනි තත්ත්ව ඒ අතර ප්‍රධාන වේ. මිනිසාට ජීවය දෙන පරිසරයට මිනිසා විසින් ම කරනු ලබන විවිධ අකටයුතුකම් නිසා ස්වභාව ධර්මය මිනිසාට එරෙහිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ස්වාභාවික ව්‍යසන ඇති වේ යැයි සැලකේ. එම නිසා ස්වාභාවික විපත්වලින් ජනතාව මුදවා ගැනීමත් එමගින් විනාශ වන දේපළ හා ජීවිත රැකගැනීමත් සඳහා ක්‍රමෝපාය යෙදීම මිනිසාගේ පරම යුතුකම බව කිව යුතු ය.

(ලකුණු 25 යි)

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

"වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවලට කිසිම නෑ සබඳකමක් නැති අපූරුවක් නොව ක්‍රමයෙන් වෙනස් වීමෙන් අලුත් ස්වරූපයක් ගත් පැරණි කෙටිකතාවමයි." යනු මාර්ටින් වික්‍රමසිංහගේ කියුමකි. ඔහු මේ මතය පවසන්නේ වර්තමාන සිංහල කෙටිකතාව අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, සිංහල ජාතක පොත යනාදි අපේ චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හා සම්බන්ධ කරමිනි. වික්‍රමසිංහ විශේෂයෙන් ම සිංහල ජාතක කථාත් වර්තමාන කෙටිකතාත් අතර බොහෝ සමාන ලක්ෂණ දකින්නේ වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලිනි. වර්තමාන කෙටිකතා ජාතක කථාවලින් වෙනස් වන්නේ වස්තු විකාසනය අතින් බව ඔහු පෙන්වා දී ඇත්තේ ය.

චිරන්තන සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තාගේ කථා ආදි ජන කතාන්තර, කවි කොළ යනාදි වශයෙන් කථා ප්‍රවෘත්ති කියැවෙන ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග රාශියක් අපට ඇත.

ප්‍රමාණය අනුව සලකන කල කෙටි වූ කතාවේ ඉතිහාසය බොහෝ ඈතට දිවෙන නමුත් නවකථාව, කෙටිකතාව යන නම් ඇති ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත නව සාහිත්‍යාංග දෙක සිංහලයට පුරුදු වූයේ බටහිර සාහිත්‍යයේ ආභාසය ඇති ව බව කිව මනා ය. මෙරට ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු සාහිත්‍යය මෙහි පැතිරී යාමත් සමග ම ඒ සාහිත්‍යය ආදර්ශයට ගෙන ඉන් ආභාසය ලබමින් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමට ගත් එක් උත්සාහයක එක් ප්‍රතිඵලයකි, මෙරට වර්තමාන කෙටිකතාව ආරම්භ වීම. එසේ ම සිංහල පුවත්පත් සඟරා ද කෙටිකතාවේ දියුණුවට මහත් රුකුලක් වූයේ ය.

(ලකුණු 10 යි)

HELPMATE

[අටවැනි පිටුව බලන්න.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පූර්ව බෞද්ධ යුගයේ සමාජ ජීවිත තත්ත්වය පිළිබඳ වටිනා තොරතුරු රැසක් 'ජාතක කථා' මගින් අනාවරණය වන්නේ ය. ඒ සමාජයෙහි අධ්‍යාපනයට ලැබුණේ විශිෂ්ට තැනකි. මේ කථාවලට අනුව ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය අත් වූයේ බ්‍රාහ්මණයනට, රාජවංශිකයනට සහ ධනවත් ව්‍යාපාරිකයනට පමණි. ඒ සමාජයේ හැම විට ම පාහේ ගුරුකමෙහි නියුක්ත වූයේ බ්‍රාහ්මණ වංශිකයෙකි. හෙතෙම දිසාපාමොක් ඇදුරු –දිසාවේ ප්‍රධාන ආචාර්යවරයා– යනුවෙන් හැඳින්විණි. විශාල ප්‍රදේශයක ඉගැන්වීමේ කටයුතුවල භාරය පැවරුණේ එබඳු ආචාර්යවරයකුට ය.

දිසාපාමොක් ආචාරීන් කෙරෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි දේශපාලන විද්‍යාව සහ යුද්ධ පුහුණුවක් ද ඇතුළත් විය. මේ ඉගෙනීම වයස දහසය වන විට නිමාවට පත් කළ බව පෙනේ. තරුණයන් විවාහ ජීවිතයට ඇතුළු වීමත් පියවරුන්ගේ වගකීමෙන් කොටසක් තමන් කෙරෙහි පවරා ගැනීමත් සොළොස් වියෙහි දී සිදු වීම සාමාන්‍ය සිරිත විය.

සැම පුරාතන සංස්කෘතියකට ම පොදු වූ අයුරින් භාරතීය සංස්කෘතියේ සියලු අධ්‍යාපන සහ අධ්‍යයන විධි වාචික මාධ්‍යය උපයෝගි කොට ගති. එවක ලිවීමේ කලාව ගැන දැනීම නුවූ බව මින් අදහස් නො කැරෙයි. ලියුම් සහ වෙනත් ලේඛන ගැන සඳහන් නොයෙක් තැන් වෙයි. වේදේහ රජුගේ බිසව වූ උදුම්බරා දේවිය මහෞෂධ පණ්ඩිතයනට අග්ගලාවෙක සඟවා ලියුමක් යැවූ බව උම්මග්ග ජාතකයෙහි සඳහන් වෙයි. මහෞෂධයන්ගේ බිරිඳ වූ අමරා දේවිය විසින් තමා හට අල්ලස් සඳහා තෑගි එවූ තැනැත්තන්ගේ නම් ද ඒ තෑගි පිළිබඳ විස්තර ද ඒවා එවුණු දින මාසාදිය ද තල් පතක ලියා තැබුණු වග ඒ කථාවෙහි ම පැවසෙයි.

තව ද ශිෂ්‍යයන් යම් කරුණක් පොතපත කියවීමෙන් දැනගත් බව කිව හැකි නො වේ. කියවීම සඳහා පිළියෙල වූ පොතපතක් නො වූ බැවිනි. ගුරුවරයා කට වචනයෙන් ඉදිරිපත් කළ සූත්‍රයන් ඉගෙන ගෙන ධාරණය කරනු වස් නොයෙක් විට පුනරුච්චාරණය කිරීම ශිෂ්‍යයා විසින් කරනු ලැබිය යුතු ය. උගත් මිනිසා හැඳින්වූයේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති යන අරුත දෙන බහුශ්‍රැත යන සකු වදනෙනි.

(i) ජාතක කථාවලින් හෙළිවන පරිදි ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය උදාවූයේ කවුරුන්ට ද?

(ii) දිසාපාමොක් ආචාරීන්ගෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි ඇතුළත් අංග කවරේ ද?

(iii) ජීවිතයේ සොළොස්වන විය වැදගත් කොට සලකනු ලැබීමට හේතු වූ කරුණු මොනවා ද?

(iv) පුරාතන භාරතීය සංස්කෘතියේ ලිවීමේ කලාව පැවති බව තහවුරු කිරීමට දක්වා ඇති සාධක කවරේ ද?

(v) පොතපත කියවීමෙන් නොව කට වචනය හා ධාරණය මුල් කොට ගෙන පැරණි ශිෂ්‍යයන් ශාස්ත්‍ර උගත් බව සනාථ කිරීමට මෙම ලේඛකයා යෙදූ සාධක **දෙක** මොනවා ද?

(ලකුණු 10 යි)

**5.** පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන **අත් පත්‍රිකාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

ජයනි කරුණාතිලක වන ඔබ අනුරාධපුර මහ වීදියේ, අංක 42 දරන ස්ථානයේ 'සයුර' නමින් පොත්හලක් විවෘත කිරීමට සැලසුම් කරමින් සිටින්නෙහි ය. එය දිනපතා පෙ. ව. 8.00 සිට ප. ව. 7.00 තෙක් විවෘත ව තිබෙන අතර පෝය දිනවල දී වසා තැබේ. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන් ම පාසල් උපකරණ ද මිලට ගැනීමේ අවස්ථාව මෙමගින් උදා කෙරෙයි. ජනවාරි මාසය තුළ මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10%ක වට්ටමක් ද ලබා දීමට අපේක්ෂා කෙරේ.

**නැතහොත්**

පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පුවත්පතක පළකිරීම සඳහා යෝග්‍ය **වාර්තාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

තුරුසරුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද කලා උළෙළට සහභාගි වූ පුවත්පත් වාර්තාකරුවකුගේ සටහනක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දිනය | : | 2018.11.30 |
| වේලාව | : | ප. ව. 2.00 |
| ස්ථානය | : | ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය, තුරුසරුගම |
| ප්‍රධාන ආරාධිතයා | : | ප්‍රවීණ කලාකරු සමරනාථ එදිරිසූරිය |
| විශේෂ දේශනය | : | මහාචාර්ය සුසිල් රාජකරුණා |
| මාතෘකාව | : | සාහිත්‍යයේ නව ගමන්මග |

තිළිණ හා සහතිකපත් ජයග්‍රාහකයන් වෙත පිරිනැමීම මෙදින සිදු විය. ප්‍රදේශයේ සාහිත්‍යකරුවන් තිදෙනකුට ද 'සාහිත්‍යදීපනී' සම්මානය පිරිනැමිණි. නැටුම් ගැයුම් ආදි විචිත්‍රාංග රාශියක් ද තිබිණ. පුවත්පත් වාර්තාකරු ඔබ යැයි සිතන්න.

(ලකුණු 15 යි)

* * *

HELPMATE

294620

OL/2018/21/S-III

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

සිංහල භාෂාව හා සාහිත්‍යය III
சிங்கள மொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

2018.12.04/ 1300 - 1500

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ කුමක් ද?
(ආ) ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍ය **දෙකක්** නම් කරන්න.

(ii) ගුත්තිල ඇදුරු **සඳ**
......................................
......................................
සුදුසු අස්නෙක ගොසින් උන් **සඳ**

(අ) මෙම කවියේ මැද පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iii) "මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අහන්නේ?"
(අ) මෙම පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(iv) **නිදහස මහ මුහුදක් වේ**
එහි උල්පත පුත, නුඹ වේ
(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් පැදි පෙළේ නම කුමක් ද?

(v) "මම යන්නට නොනිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විස්වස් නැති."
(අ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය රචිත යුගය නම් කරන්න.
(ආ) මෙහි සඳහන් විශ්වාස නොකට යුතු සතර දෙනාගෙන් එක් අයකු සඳහන් කරන්න.

(vi) (අ) 'අපට වැසිකිළියක්' කෙටිකතාව ඇතුළත් කෙටිකතා සංග්‍රහය නම් කරන්න.
(ආ) මෙම කෙටිකතාවේ රචකයාගේ නම කුමක් ද?

(vii) "හොඳට ම වැඩි වුණොත් ඒක වට්ටි ජරන්කු පන්සීයක්"
(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?
(ආ) මෙහි 'ජරන්කු' යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද?

(viii) සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ
(අ) මේ පද්‍ය ඛණ්ඩය මුළින් ම පළ වූ කෘතිය කුමක් ද?
(ආ) මේ කෘතියේ රචකයා විසින් රචනා කරන ලද නවකතා **දෙක** නම් කරන්න.

HELPMATE

[දෙවැනි පිටුව බලන්න.

(ix) (අ) රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය නම් කරන්න.

(ආ) "**ගිම්හානයේ ගිලන් වී කෘශ ව** **සුදුමැලි ව**
ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය"
මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාඨයෙන් පැවසෙන අදහස ලියන්න.

(x) (අ) කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය **දෙකක්** නම් කරන්න.

(ආ) "සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර"
මෙහි 'සකිසඳ' යනුවෙන් ආමන්ත්‍රණය කර ඇත්තේ කාට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **රිවි** **තැවුලේ** පිපි කමලේ විල් ගැවසී
**මත** **කොවුලේ** තුරු වදලේ හඬන නිසී
වන සැවුලේ මඟ අසලේ පොර සැලසී
ගුරු බැවුලේ යව අවුලේ නොවී කිසී

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මෙම කවියෙන් කියැවෙන ගුරු බැවුලේ ස්වභාවය විස්තර කරන්න.

(ii) "තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නොවෙයි. තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙම්හ."

(අ) මෙහි තරම් නොවෙයි යන්නෙන් අදහස් කළේ කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තා දැක්වූ ප්‍රතිචාරය කුමක් ද?

(iii) "තො අඟුල්මල්හු කෙහෙ බහා සිවුරු හැඳ පෙරෙවැ පැවිජි වැ පණිවා ඈ පව්කැමින් විරත වැ එක් වෙලෙ වළඳා බඹසරවත් රැකැ සිල්වත් වැ කලණදහම් පුරා වසන්නහු දිටිහි නම්, උහුට කුමක් කෙරෙහි?"

(අ) මෙම පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) දුටු සත සිතට තුටු වන ලෙසට නිතියෙනි
සතර'ත එකට සම කර බෙර ඇසක් මෙනි
පැහැපත සුද නොහළ වැලි අතුළ මළු තැනි
මිහිකත සඳන'ලෙව් දුන් උර මඬල වැනි

(අ) ඉහත සඳහන් කවියෙහි අන්තර්ගත උපමා **දෙකක්** ලියන්න.

(ආ) සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(v) රැති වනපෙතිනැවිදින් **සුමුවෝයා**
නිති මියුරැති වෙණ නදළමුවෝයා
සිතිවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් **සමුවෝයා**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මුවන්ගේ මෙම හැසිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ලකුණු 04 × 5 = 20 යි)

**3.** බාහිර බලවේග නිසා පුද්ගල මනෝභාවයන්

(i) ප්‍රචණ්ඩත්වය කරා යොමු වන අයුරුත්

(ii) යළිත් ශික්ෂාකාමී ලෙස සමාජානුගත වන අයුරුත් 'අඟුල්මල් දමනය' කතාවෙන් මනාව නිරූපණය වෙයි. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) පරිසර වර්ණනා රසවත් ලෙස ඉදිරිපත් කිරීමටත්

(ii) යමක අසිරිය තත්ත්වාකාරයෙන් දැකීමටත් හංස සංදේශ කතුවරයා දක්වා ඇති කුසලතාව අගය කළ හැකි ය. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

HELPMATE

[තුන්වැනි පිටුව බලන්න.

**4.** (i) උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමත්

(ii) පොදු ජන වහර යොදා ගැනීමත් 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' යන ජන කවි පෙළ පාඨකයාගේ සිත් ගනී. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) අවස්ථා හා සිද්ධි නිරූපණයත්

(ii) භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් සිංහබාහු නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

● **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** විරුද්ධවාදීන්ගේ යුද්ධෝපක්‍රමවලට ප්‍රතික්‍රියා දැක්වීමේ දී මහෞෂධ පඬිවරයා පෙන්වූ කුසලතාව උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**6.** පවුල් සංස්ථාවේ සමබරතාව ආරක්ෂා කිරීමේ දී ස්වාමි පුරුෂයකුගේ වගකීම මැනවින් නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටිකතාවේ ලොයිසල්ගේ චරිතය උපයෝගි කරගත් ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**7.** පුද්ගල චරිත සංවර්ධනයෙහි ලා 'ජාතික තොටිල්ල' පද්‍ය පන්තියෙන් නිරූපිත අදහස් උපයෝගි කර ගත හැකි ආකාරය, උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

* * *

HELPMATE

HELPMATE